සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ] All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# දෙවැනි වාර ඇගයීම -2016
இரண்டாம் தவணை மதிப்பீடு -2016
Second Term Evaluation -2016

| 10 ශ්‍රේණිය<br>10 கலுமுயமுளா<br>Grade 10 | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I පත්‍රය**<br>தொடர்பாடலும் ஊடகக்கற்கையும் I<br>Communication & Media Studies I | *පැය එකයි*<br>*1 மணித்தியாலம்*<br>*One Hour* |
|---|---|---|

සැලකිය යුතුයි:
- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරු වලින් වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සන්නිවේදන ක්‍රියාවලිය අරම්භ වන සන්නිවේදන වර්ගය වන්නේ,
- i පුද්ගලාන්තර සන්නිවේදනය යි.
- ii අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය යි.
- iii උත්තේජන ප්‍රතිචාර සම්බන්ධය යි.
- iv මනෝභාවයන් හා ප්‍රතික්‍රියා යි.

02 මානව සමාජයට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම
- i ජනසන්නිවේදනයේ අරමුණකි.
- ii අධ්‍යාපනයේ අරමුණකි.
- iii ග්‍රාහකයාගේ අරමුණකි.
- iv සමාජ සංවිධාන අරමුණකි.

03 පුද්ගලයාගේ සිත තුළ සිදුවන සන්නිවේදනය ලෙස හඳුන්වන්නේ,
- i අන්තර් පුද්ගල සන්නිවේදනය යි.
- ii විධිමත් සන්නිවේදනය යි.
- iii අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය යි
- iv සාම්ප්‍රදායික සන්නිවේදනය යි.

04 පහත සඳහන් ප්‍රකාශ අතුරින් සන්නිවේදනය යන්නට වඩාත් සුදුසු ප්‍රකාශය මින් කුමක් ද?
- i කිසියම් පණිවිඩයක් ලබා දීමේ වැඩපිළිවලකි.
- ii එකිනෙකා අතර සංඥා හුවමාරු කර ගැනීමකි.
- iii එදිනෙදා ජීවත්වීම සඳහා මිනිසාට නැතුවම බැරි දෙයකි.
- iv සන්නිවේදනය සත්ත්වයින්ගේ පරිනාමය වූ දා පටන් බැඳි පවතී.

05 ලැස්වෙල් අර්ථකථනයට අනුව සන්නිවේදනාංග අනුපිළිවෙළ දක්වා ඇත්තේ
- i තොරතුරු මූලාශ්‍ර, සම්ප්‍රේෂණය, සංඥාව, ග්‍රාහකයා, අග්‍රස්ථානය.
- ii පණිවිඩය, සංඥාව, ලැබූ සංඥාව, ග්‍රාහකයා, සන්නිවේදනය.
- iii සන්නිවේදකයා, පණිවිඩය, මාධ්‍ය, ග්‍රාහකයා, බලපෑම.
- iv කෙනෙක්, යම් කිසිවක්, යමෙක්, බලපෑමක්, නාලියක්.

06 මුද්‍රිත අත්පත්‍රිකාවක කලු ඉරි වශයෙන් ඇඳි අකුරු අපහැදිලිවීම සන්නිවේදන බාධක වලට අනුව,
- i මාධ්‍ය බාධකය කි.
- ii පරිසර බාධකය කි
- iii අර්ථ බාධකය කි.
- iv තාක්ෂණික බාධකය කි.

07 සන්නිවේදනයේ දී ප්‍රදීපාගාර උපක්‍රමය භාවිත කිරීම වඩාත් සුදුසු වන්නේ,
- i සාගර ආශ්‍රිත කර්මාන්ත වල යෙදී සිටින ධීවර ජනතාවට.
- ii සමූහ සන්නිවේදනයේ ඇස් සම්බන්ධතාවය තබා ගැනීමට.
- iii ජනමාධ්‍ය ග්‍රාහකයන්ගේ ප්‍රතිචාර නිරීක්ෂණයට.
- iv ප්‍රධාන මාර්ගය තුළ රථවාහන හැසිරවීමට.

08 කෙනෙකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සන්දේශ ග්‍රහණය කර ගෙන එය තේරුම් ගැනීම,

i සමාජානුයෝජනය යි.  ii සංජානනය යි.

iii පෙළඹවීම යි  iv සංවාදය යි.

09 පහත සඳහන් ප්‍රකාශ අතුරින් ජනසන්නිවේදනය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වනුයේ,

A - සන්දේශය පොදු වුවකි.
B - සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ.
C - සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වේ.
D - මූලික වශයෙන් ඒකමාර්ගිකව සිදු වේ.

i A, B හා C පමණි  ii A, B හා D පමණි.

iii B, D හා C පමණි  iv A, B,C හා D යන සියල්ලම.

10 නිසි පරිදි පාසල් නො එන ශිෂ්‍යයන්ට විභාගයට පෙනී සිටීමට නොහැකි වන බව විදුහල්පතිතුමා විසින් ගුරු මණ්ඩල රැස්වීමේ දී දන්වන ලද අතර, ගුරුවරුන් එය පන්ති කාමරයේ දී ප්‍රකාශ කළේ නිසි පරිදි පාසැල් එන ශිෂ්‍යයන්ට පමණක් විභාගයට පෙනී සිටීමට හැකි වන බවයි.

i මාධ්‍ය බාධකය කි.  ii ද්වි මාර්ගික සන්නිවේදනය යි.

iii අර්ථ බාධකයය යි.  iv දොරටුපාල සංකල්පය යි.

11 පහළ සිට ඉහළට සන්නිවේදනය කිරීමට යොදාගත හැකි විධිමත් සන්නිවේදන ක්‍රමයක් වන්නේ,

i මහා සභා රැස්වීම.  ii දැන්වීම් පුවරු.

iii චක්‍ර ලේඛ  iv යොජනා පෙට්ටි.

12 කාය භාෂාව බහුලව ම ඉවහල් කරගෙන සිදුවන සන්නිවේදන ස්වරූපය වන්නේ,

i අවාචික සන්නිවේදනයයි.  ii වාචික සන්නිවේදනයයි.

iii දෘශ්‍ය සන්නිවේදනයයි.  iv ශ්‍රව්‍ය සන්නිවේදනයයි.

13 දෘශ්‍ය සන්නිවේදනය ක්‍රමයක් වශයෙන් පුරාණ මිනිසා භාවිතා කළ පැරණිතම සන්නිවේදන ක්‍රමයක් වන්නේ

i ගින්දර හා පැපිරස්පත්  ii සංදේශ හා කොඩි වැල්

iii ගින්දර හා දුම්  iv හූව හා ලිපි

14 භාෂාව පදනම් කරගෙන කථනය මගින් සිදුවන සන්නිවේදනය,

i ලිඛිත සන්නිවේදනයයි.  ii ශ්‍රව්‍ය සන්නිවේදනයයි.

iii දෘශ්‍ය සන්නිවේදනයයි.  iv වාචික සන්නිවේදනයයි.

15 ජාතික උත්සවයක දී විවිධ ජාතීන්ට අයත් පුද්ගලයින් තමන්ට ආවේණික වූ ඇඳුම් පැලඳුම් භාවිත කිරීම තුළින් පැහැදිලි වන්නේ,

i දෘශ්‍ය සන්නිවේදනයකි.  ii ආවාචික සන්නිවේදනයකි.

iii අවිධිමත් සන්නිවේදනයකි.  iv විධිමත් සන්නිවේදනයකි.

16 සමීපතමයන් සමඟ සන්නිවේදනයේ යෙදෙන විට ඔබ සම්බන්ධ වන අවකාශය වන්නේ,

i සහෘද අවකාශය  ii පෞද්ගලික අවකාශය

iii සාමාජීය අවකාශය  iv මහජන අවකාශය

17 මෑතක දී රූපවාහිනියේ ප්‍රදර්ශනය කළ දැන්වීමක් පිළිබඳ කථාබහ ඉක්මනින් ප්‍රදේශය පුරා පැතිර ගියේය. ඒ තුළින් සිදුවනුයේ,

i නිර්මාණාත්මක සන්නිවේදනය  ii වාචික සන්නිවේදනයකි.

iii අවිධිමත් සන්නිවේදනයකි.  iv විධිමත් සන්නිවේදනයකි.

18 විවිධ මාධ්‍ය එනම් සඟරා, පුවත්පත්, පොත්, ගුවන්විදුලිය, රූපවාහිනිය, සිනමාව, ජංගම දූරකථනය, අන්තර්ජාලය ආදී වූ මාධ්‍යයන් එක්වීම නැතහොත් 'එකට හමුවීම' හඳුන්වනු ලබන්නේ,

i නූතන මාධ්‍ය ලෙසය.  ii ජනමාධ්‍ය ලෙසය.

iii අභිසාරී මාධ්‍ය ලෙසය.  iv විද්‍යුත් මාධ්‍ය ලෙසය.

19 පහත සඳහන් ප්‍රකාශ තුළින් කියවෙන්නේ කුමන සන්නිවේදන වර්ගයක් පිළිබඳව ද?

- o ආදරය, කරුණාව හුවමාරු කර ගැනීම.
- o මානසික පීඩා අවම කර ගැනීම.
- o කාර්යයන් නිම කර ගැනීම.
- o සතුට අත්පත් කර ගැනීම.

i ද්විපුද්ගල සන්නිවේදනය. ii කණ්ඩායම් සන්නිවේදනය.
iii අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය iv ජනසන්නිවේදනය.

20 පාසැල් මිතුරන් අතර සිදු වූ ආරවුලක් පිළිබඳව කෝලිත තම හොඳම මිතුරා සමඟ ප්‍රකාශ කළේ ය. මිතුරා එම ආරවුල පිළිබඳ ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් හට ප්‍රකාශ කළේය. මෙහි දී සිදු වූ සන්නිවේදන ක්‍රියාදාමය,

i තනි දාමයකි. ii ඔපාදූප දාමයකි.
iii සම්භාවිතා දාමයකි. iv පර්ෂද දාමයකි.

21 ලිඛිත සන්දේශයක් ඉතා ඉක්මනින් යැවිය හැකි වන්නේ,

i ෆැක්ස් මගින් ii තැපැල් මගින්.
iii විදුලි පණිවිඩ මගින්. iv ඊතල මගින්.

22 පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය ප්‍රධාන පියවර හතර අනු පිළිවෙළින් වනුයේ,

i අත් පිටපත සැකසීම, අකුරුයෝජනය හා පිටු සැලසුම් කිරීම, මුද්‍රණය හා පිටපත්කරණය, නිමි කටයුතු
ii අකුරුයෝජනය හා පිටු සැලසුම් කිරීම, අත් පිටපත සැකසීම, මුද්‍රණය හා පිටපත්කරණය, නිමි කටයුතු
iii මුද්‍රණය හා පිටපත්කරණය, අත් පිටපත සැකසීම, අකුරුයෝජනය හා පිටු සැලසුම් කිරීම, නිමි කටයුතු
iv අත් පිටපත සැකසීම, මුද්‍රණය හා පිටපත්කරණය, අකුරුයෝජනය හා පිටු සැලසුම් කිරීම, නිමි කටයුතු

23 අන්තර්ජාල භාවිතයට අත්‍යවශ්‍ය උපකරණය

i විනිවිදක ප්‍රක්ෂේපන යන්ත්‍රය ii මුද්‍රණ යන්ත්‍රය
iii ගණක යන්ත්‍රය iv දුරකථනය

24 විද්‍යුත් තැපැල් ක්‍රමය, ෆැක්ස් ක්‍රමයට වඩා ඵලදායී සන්නිවේදන ක්‍රමයක් වන්නේ,

i ක්ෂණිකව සම්ප්‍රේෂණය කළ හැකි වීම. ii තොරතුරු ලිඛිතව ඉදිරිපත් කළ හැකි වීම.
iii පිරිවැය පිරිමැසුම්දායක වීම. iv මාධ්‍ය බාධක අවම කර ගත හැකි වීම.

25 ඉගැන්වීමෙහි යෙදෙන දේශකයා පන්ති කාමරයේ ඇති කළුලෑල්ල මෙන්ම සුදු ලෑල්ලද භාවිතා කළේය. එම මාධ්‍ය උපකරණ,

i ප්‍රක්ෂේපණීය උපකරණයකි. ii ප්‍රක්ෂේපණීය නොවන උපකරණයකි.
iii තොරතුරු ලිඛිතව ඉදිරිපත් කරන උපකරණයකි. iv සම්ප්‍රදායික මාධ්‍ය උපකරණයකි.

26 විධිමත් සන්නිවේදන අවස්ථාවක් ලෙස එක් අයෙකු කේන්ද්‍ර කරගෙන බොහෝ දෙනාට පැතිරී යන සන්නිවේදන අකෘතිය වනුයේ,

i චක්‍රීය ආකෘතිය (Circle Model). ii දාම ආකෘතිය (Chain Model).
iii වයි ආකෘතිය (Y Model). iv රෝද ආකෘතිය(Eheel Model).

27 පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ නිමි කටයුතු සඳහා යොදා ගන්නා උපකරණයක් වනුයේ,

i ඡායා පිටපත් යන්ත්‍රය. ii ලේසර් මුද්‍රණ යන්ත්‍රය.
iii ලැමිනේටින් යන්ත්‍රය. iv බබල්ජෙට් මුද්‍රණ යන්ත්‍රය.

28 මූලික වශයෙන් පුවත්පත හා ගුවන් විදුලිය යන මාධ්‍ය පදනම් වී ඇත්තේ

i වාචික සන්නිවේදනය මත ය. ii නිර්මාණාත්මක සන්නිවේදනය මත ය.
iii ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය මත ය. iv ලිඛිත හා කථන සන්නිවේදනය මත ය.

29 පරිගණකයක් ආශ්‍රිතව සූදානම් කර ගත් වගන්ති, ප්‍රස්ථාර සහ රූප සටහන් ප්‍රදර්ශනය කරගැනීමට යොදාගත හැකි පහසුම උපකරණය වන්නේ,

i ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. ii බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.
iii විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. iv ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයයි.



The National e-learning Portal for The General Education

30 කම්බියක් ඔස්සේ හඬ යැවීමෙන් දුරකථනය නිපදවනු ලැබුවේ,

| | | | |
|---|---|---|---|
| i | ග්‍රැහැම්බෙල් විසිනි | ii | ගුටෙන්බර්ග් විසිනි' |
| iii | මෝස් විසිනි. | iv | මාකෝනි විසිනි. |

31 වෙබ් අඩවියක් පවත්වා ගෙන යාම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. එයින් අසත්‍ය ප්‍රකාශ වනුයේ,

A - කාර්යාලයේ කාර්යයන් සමාජයට විවෘත වීම.
B - කාර්යාලයේ තොරතුරු යාවත්කාලීන කිරීමට හැකිවීම.
C - වෙබ් අඩවිය ඔස්සේ විවිධ ප්‍රතිචාර වහා ලබා ගත නොහැකි වීම.
D - කාර්යාලයේ කටයුතු වඩාත් විධිමත් ව හා පිළිවෙළකට කළ හැකි වීම.

i A ය. ii B ය. iii C ය. iv D ය.

32 ජනමාධ්‍ය ආයතනයන් හි අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය මෙහෙයවනු ලබන්නේ,

| | | | |
|---|---|---|---|
| i | අධ්‍යක්ෂක ය. | ii | නිෂ්පාදක ය. |
| iii | ප්‍රධාන විධායක ය. | iv | ලේකම් ය. |

33 පහත සඳහන් ජනමාධ්‍ය අතුරින් පෞද්ගලික ජනමාධ්‍ය ආයතනයක් වන්නේ,

| | | | |
|---|---|---|---|
| i | ලක්හඬ ගුවන් විදුලි සේවාව යි. | ii | විජය නිවුස් පේපර්ස් ආයතනය යි. |
| iii | .. ලේක්හවුස් ආයතනය යි. | iv | ස්වාධීන රූපවාහිනී සේවය යි. |

34 ශ්‍රී ලංකාවේ පළ වූ ප්‍රථම සිංහල පුවත්පත වන්නේ,

| | | | |
|---|---|---|---|
| i | ලංකාලෝකය යි. | ii | ලක්මිණි පහණ යි. |
| iii | ඥානාර්ථ ප්‍රදීපය යි. | iv | සිංහල බෞද්ධයා යි. |

35 පෞද්ගලික මාධ්‍ය ආයතනයන් ආදායම් උපයා ගැනීම ප්‍රධාන මූලාශ්‍රය වන්නේ,

| | | | |
|---|---|---|---|
| i | රාජ්‍ය අනුග්‍රහය තුළිනි. | ii | පරිත්‍යාගශීලීන්ගෙනි. |
| iii | මාධ්‍ය අවකාශය අලෙවි කිරීමෙනි. | iv | සුබපතන්නන්ගෙනි. |

36 ජනමාධ්‍ය ආයතනයක ප්‍රතිපත්ති සකස් කරනු ලබන්නේ,

| | | | |
|---|---|---|---|
| i | ග්‍රාහකයින් ය. | ii | ජනමාධ්‍යවේදීන් ය. |
| iii | දැන්වීම්කරුවන් ය. | iv | හිමිකරුවන් ය. |

37 පුවත්පත් ආයතනික ව්‍යුහයක ප්‍රධාන අංග වන්නේ,

i පාලන අංශය, කර්තෘ මණ්ඩලය, දැන්වීම් අංශය, මුද්‍රණ හා බෙදා හැරීම් අංශයයි.
ii කර්තෘ මණ්ඩලය, ලේඛක මණ්ඩලය, දැන්වීම් අංශය හා බෙදාහැරීමේ අංශයයි.
iii අධ්‍යක්ෂ මණ්ඩලය, කර්තෘ මණ්ඩලය, මුද්‍රණ අංශය හා අලෙවි ප්‍රවර්ධන අංශයයි.
iv දැන්වීම් අංශය, පිටු සැකසුම් අංශය, සෝදුපත් අංශය හා මුද්‍රණ අංශයයි.

38 රාජ්‍ය මාධ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ප්‍රභේද වලට පදනම් වන මූලික සාධක වන්නේ එහි,

| | | | |
|---|---|---|---|
| i | පරිපාලනය යි | ii | ග්‍රාහකත්වය යි. |
| iii | අයිතිය යි | iv | ව්‍යාප්තිය යි. |

39 මුද්‍රණ ශිල්පය ආරම්භ කරන ලද රට වන්නේ,

i ජපානය. ii චීනය. iii ජර්මනිය. iv කොරියාව.

40 ජනමාධ්‍ය ආයතන හා රාජ්‍ය අරමුණු අතර සහසම්බන්ධය පිළිබඳ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

i රජය ස්ථාවර ව පවත්වා ගෙන යාමට යොදා ගැනීම.
ii විවිධ සංවර්ධන සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
iii මහජනයාට ලබා දෙන තොරතුරු සෘජුව හා වක්‍රව පාලනය කිරීම.
iv රජයේ ප්‍රතිපත්ති හා දර්ශනයන් මහජනයා තුළ තහවුරු කිරීම.

සියලුම හිමිකම් ඇවිරිණි | முழுப் பதிப்புரிமையுடையது | All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

**දෙවැනි වාර ඇගයීම -2016**
இரண்டாம் தவணை மதிப்பீடு -2016
Second Term Evaluation -2016

| 10 ශ්‍රේණිය<br>10 கலுமுயமுளா<br>Grade 10 | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II පත්‍රය**<br>தொடர்பாடலும் ஊடகக்கற்கையும் II<br>Communication & Media Studies II | පැය දෙකයි<br>2 மணித்தியாலம்<br>Two Hour |
|---|---|---|

<u>සැලකිය යුතුයි:</u>

- ❖ පළමු ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ❖ ලකුණු 60 යි.

01. සමගි සංවර්ධන බැංකුවේ ඉහළ කළමනාකාරිත්වය තම සේවකයන් දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් සංවිධානය කරන ලදි.

I. ඉහත වැඩමුළුවට යොදාගත හැකි සන්නිවේදන වර්ගයක් නම් කර උදාහරණ සපයන්න.
II. ඉහත වැඩමුළුවට සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරන සන්නිවේදන විධි හෙවත් ස්වරූප දෙකක් නම් කරන්න.
III. සේවකයන් දැනුවත් කිරීම සඳහා යොදාගත හැකි මුද්‍රිත මාධ්‍ය මෙවලම් දෙකක් නම් කරන්න.
IV. මෙහි දී මුද්‍රිත මාධ්‍ය මෙවලම්වල සිදුවිය හැකි මාධ්‍ය බාධක අවස්ථා දෙකක් නම් කරන්න.
V. මුද්‍රිත පිටපත් 30 කට අධික ප්‍රමාණයක් ලබා ගැනීමට පහසු පරිගණක මුද්‍රණ යන්ත්‍ර වර්ග දෙකක් නම් කරන්න.
VI. මෙම වැඩසටහන පිළිබඳ අභ්‍යන්තර අධීක්ෂණය කිරීම සඳහා යොදා ගත හැකි රූපවාහිනී කැමරා පරිපථය කුමක් ද?
VII. ඉහත සිදුවීමෙහිදී දැකිය හැකි පාරිසරික සාධක දෙකක් නම් කරන්න.
VIII. මෙම වැඩමුළුව භාවිතා කළ හැකි ප්‍රක්ෂේපණීය නොවන උපකරණයක් නම් කර භාවිතාව පිළිබඳ පැහැදිලි කරන්න.
IX. මෙම වැඩමුළුව සඳහා භාවිතා කළ හැකි ප්‍රක්ෂේපණීය උපකරණ දෙකක් නම් කරන්න.
X. වැඩමුළුවට අදාළ ලිපි ලේඛනවල ඉක්මනින් ම තොරතුරු හුවමාරු කළ හැකි සන්නිවේදන උපකරණ දෙකක් නම් කරන්න.

(ලකුණු 20)

02 පහත සඳහන් කරුණු ඇසුරෙන් සන්නිවේදනය හඳුන්වන්න.

I. සංජානනය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?
II. සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක් නම් කරන්න.
III. ද්වි මාර්ගික සන්නිවේදන සූත්‍රය රූප සටහනක් ඇසුරෙන් දක්වන්න.
IV. සන්නිවේදනය පිළිබඳ ලැස්වෙල් අර්ථකථනයට අනුව සන්නිවේදන මූලික අංග 4ක් නම් කර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

03 සන්නිවේදන වර්ගීකරණය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. සමූහය හා කථිකයා අතර සම්බන්ධතාවය පවත්වා ගැනීමට යොදාගත හැකි තාක්ෂණික මෙවලම් දෙකක් නම්කර පැහැදිලි කරන්න.
II. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය ඇසුරෙන් පුද්ගලයාගේ මනෝභාවයන් හා ප්‍රතික්‍රියා සිදුවන ආකාරය හඳුන්වන්න.
III. අන්තර්පුද්ගල සන්නිවේදනයේ විශේෂතා තුනක් නම් කර පැහැදිලි කරන්න.
IV. ජනසන්නිවේදයේ ස්වභාවය පිළිබඳ කරුණු හතරක් නම් කරන්න.

(ලකුණු 10)

04 නොසන්සුන්ව තිබූ රැස්වීමක් සඳහා පැමිණි කථිකයා හැකි ඉක්මනින් ග්‍රාහකයන්ගේ අවධානය ලබා ගැනීම සඳහා ඔවුන් සැම දෙනාගේම ඇස් සම්බන්ධතාවය ලබා ගැනීමට සමත් විය.

I. ඉහත රැස්වීමේ දී කථිකයා සමූහය සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහා භාවිත කළ උපක්‍රමය කුමක් ද?

II. ඉහත නම් කළ උපක්‍රමය සංක්ෂිප්තව පැහැදිලි කරන්න.

III. සමූහ සන්නිවේදනයේ විශේෂතා හයක් නම් කරන්න.

IV. මෙහි දී භාවිතා කළ විධිමත් හා අවිධිමත් සන්නිවේදන ආකෘතිය බැගින් නම් කර යොදාගත හැකි ආකාරය උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

05 SDV ආයතනයේ සේවය සඳහා පළමුව අයදුම් පත්‍රයක් යොමු කළ නිල්නෙතු සඳගෝමි, පසුව තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් විය.

I. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ඵලදායි ලේඛනයක් ලෙස අයදුම් පත්‍රයේ ඇතුළත් විය යුතු ලක්ෂණ දෙකක් නම් කරන්න.

II. අයදුම් පත්‍රය සකස් කර ගැනීම සඳහා පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය භාවිතා කිරීමේ දී අනුගමන කළ යුතු ප්‍රධාන පියවර හතර නම් කර පැහැදිලි කරන්න.

III. ඉහත සඳහන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත තමාගේ හැකියාවන් ඉදිරිපත් කිරීම සඳහා යොදාගත හැකි වාචික භාෂා කුසලතා තුනක් නම් කර පැහැදිලි කරන්න.

IV. තමාගේ පෞරුෂත්වය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සන්නිවේදනය කිරීමට යොදාගත හැකි ශාරීරික සාධක හතරක් නම් කරන්න.

(ලකුණු 10)

06 පුවත්පත් කාර්යාලයක පහත සඳහන් කරුණු දක්නට ලැබේ.

I. සමහර වාර්තාවල ප්‍රවෘත්ති ඡායාරූප ඇතුළත් ව තිබුණි. එහි දී දැකගත හැකි සන්නිවේදන ස්වරූපයක් නම් කර පැහැදිලි කරන්න.

II. දෛනික ලිපි ලේඛන සඳහා දින මුද්‍රාව භාවිත කරයි. දින මුද්‍රාවක ඇතුළත් අංග දෙකක් නම් කරන්න.

III. කාර්යාලයේ කිහිපදෙනෙක් පරිගණක යන්ත්‍ර මගින් පුවත් වාර්තා සකස් කරනු දක්නට ලැබුණි. පරිගණක මගින් ප්‍රවෘත්ති වාර්තා සැකසීමේ වාසි තුනක් නම් කරන්න.

IV. පුවත්පත් ආයතනයක් පොදුවේ සමන්විත වන ප්‍රධාන අංශ හතරක් මෙම ආයතනයේ ද දක්නට ලැබුණි. එම අංශ හතර නම් කර, ඒවායේ කාර්යය කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 10)

07

I. " ජනමාධ්‍ය ආරම්භය සිදුවන්නේ මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමත් සමඟය ". මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරුට හේතුව දක්වන්න.

II. "යමෙක් වාචිකව සන්නිවේදනයේ යෙදෙන විට කටහඬ තුළින් අවාචික සන්නිවේදනය සිදු වේ". මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරුට හේතු දෙකක් දක්වන්න.

III. "පන්ති කාමරය තුළ මාධ්‍ය උපකරණ භාවිතය ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක වීමට බලපානු ලැබේ". මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරුට හේතු තුනක් දක්වන්න.

IV. "පරිගණක භාවිතය මුද්‍රණ ක්‍රියාවලිය පහසු කර ඇත". මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරුට හේතු හතරක් දක්වන්න.

(ලකුණු 10)